# මහින්ද ජ වි පෙ හා විජාතික බලවේග

පසුගිය දා එක් විශ්ව විද්‍යාලයක දේශපාලන විද්‍යාව නමින් බටහිර ස්වාමිවරුන්ගේ යටත්විජිතවාදී මතවාද උගන්වන, දෙමළ ජාතිවාදීන්ගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් බෙරිහන් දෙන, එහෙත් විශ්ව විද්‍යාලයීය කථිකාචාර්යවරුන්ට තමන් සාමාජිකත්වය දරණ වෘත්තීය සමිතියක තමන් නෙරපීම පිළිබඳ කතාකිරීමට ඉඩ නොදීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදී වන බැලයකු (ඔහු විජාතික බලවේගවල වැටුප් ලබන බැලයෙකි) මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපති අපේක්ෂකත්වය ගැන පත්තර කඩමාල්ලකට ප්‍රකාශකර තිබුණේ ජ වි පෙ වැනි පක්ෂත් චින්තන පර්ෂදය වැනි මතවාදී සංවිධානත් රාජපක්ෂ මහතාට ආධාරකිරීමේ අවදානම පිළිබඳව ය. පළමුවෙන් ම බේරාගත යුතු සංකල්පිය ප්‍රශ්නයක් වෙයි. චින්තන පර්ෂදය මේ බැලයන්ගේ අනුකාරක මතවාදවලට අභියෝගකරමින් ජනතාව අතරට මතවාද ගෙනයන සංවිධානයක් බව සැබෑ ය. එහෙත් එයින් කියැවෙන්නේ චින්තන පර්ෂදය ප්‍රවාද නිර්මාණය කරන ආයතනයක් නොවේය යන්න නොවන බව අවධාරණය කළ යුතු ය. මේ බැලයන්ට ප්‍රවාද හා මතවාද යනු වර්ග දෙකකි. ඔවුන් කල්පනාකරන්නේ ප්‍රවාද නිර්මාණය කළහැක්කේ සුදු හම ඇති ඔවුන්ගේ ස්වාමිවරුන්ට පමණක්ය කියා ය. ඔවුන් ප්‍රවාද නමින් පළකරන කසිකබල් සඟරාවල ඇත්තේ බටහිරයන්ගේ මතවාදවල පුනරුච්චාරණයකි. අපට නම් ප්‍රවාද හා මතවාද අතර වෙනසක් නැත. නිව්ටන් ගුරුත්වාකර්ෂණය නමින් මතවාදයක් ඉදිරිපත්කෙළේ ය. එයට ප්‍රවාදයක් (තියරි) යැයි කියා සම්භාව්‍ය තත්ත්වයක් ලබාදීමට කටයුතු කළෝ බටහිරයෝ ය. ඔය කියන ප්‍රවාද ද මතවාදම ය. එහි වෙනසක් නැත. බැලයාට අවශ්‍ය නම් ඔහු උගන්වන විශ්වවිද්‍යාලයේදීම මේ පිළිබඳ විවාදයක් කළහැකි ය. ඒ සඳහා බැලයාට එවැනි ම කසිකබල් හිටපු මාක්ස්වාදී බැලයන් කිහිප දෙනකුගේ සහාය ලබාගත හැකි ය. මතවාද දැනුම ආදිය අතර වෙනස්කම් දකිනු ඇත්තේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ගැත්තන් ය. චින්තන පර්ෂදය දැනුම නිර්මාණය කරයි. ඒ සඳහා අප විසින් චින්තනය යන්නට නව තේරුමක් දෙනු ලැබ ඇත. අවාසනාවකට ඒ වචනය  නිතර යොදාගන්නා වචනයක් බැවින් බොහෝදෙනා එය නිවැරදිව අවබෝධකරගත් බවක් නො පෙනෙයි. කුන් පඬිවරයාගේ සුසමාදර්ශය (පැරඩයිම්) යන සංකල්පය යොදාගන්නා බොහෝ අයටද එහි තේරුම අවබෝධ නො වෙයි. එයට ප්‍රධාන හේතුව ඒ පිළිබඳ හොඳම උදාහරණ වූ නිව්ටෝනීය සුසමාදර්ශය හා අයින්ස්ටයිනීය සුසමාදර්ශය අතර වෙනස බොහෝ දෙනකුට නො තේරීම ය. එසේ වුවත් සුසමාදර්ශය නමින් සංකල්පයක් ඇති බව ඔවුහු දනිති. අවුරුදු විස්සක පමණ කාලයක් චින්තනය යන වචනය දැනුම නිර්මාණයකිරීමට අදාළව සුසමාදර්ශයට වඩා ගැඹුරු තලයක මා විසින් යොදාගැණුන ද, ඒ සිතීම යන අර්ථයෙන් නොව වෙනත් අර්ථයකින් යොදාගැනෙන්නක් බව දන්නා ඇත්තන් අතේ ඇඟිලි සංඛ්‍යාවට ද වඩා අඩුවීම නම් තරමක ගැටළුවකි.

ඒ කෙසේවෙතත් චින්තන පර්ෂදය මහින්ද රාජපක්ෂ මහතාට ආධාර කරන්නේ ඔහු ගැළවුම්කාරයා ය යන තේරුමෙන් නො වෙයි. චින්තන පර්ෂදයට එහි දී කොන්දේසි වෙයි.  එහෙත් චින්තන පර්ෂදය දේශපාලන පක්ෂයක් මෙන් කොන්දේසි ඉදිරිපත්කර ඒ පිළිබඳ සාකච්ඡා අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්කර නො ගනියි. ජ වි පෙරමුණට එසේ කළ හැකි බවට සැකයක් නැත.  ඔවුන් ඒ කළ යුතු බවට සැකයක් ද නැත. ඒ අතර දෙමළ ජාතිවාදීහු ද රාජපක්ෂ මහතාට කොන්දේසි ඉදිරිපත් කරති. අර බැලයාට ද කොන්දේසි වෙයි. ඉන් එක් කොන්දේසියක් වනු ඇත්තේ රාජපක්ෂ මහතා කිසිසේත් ජ වි පෙ, චින්තන පර්ෂදය වැනි සංවිධාන සමග සම්බන්ධකම් ඇතිකර නොගත යුතු බව ය. එහෙත් ප්‍රශ්නය වනුයේ බැලයන් කී පමණින් ජ වි පෙ සමග ඇතිකරගන්නා යම් සංධානයක්  නොමැතිව රාජපක්ෂ මහතාට ජයග්‍රහණය කළ හැකි ද යන්න ය.

මේ ඊනියා බුද්ධිමතුන්ට අවශ්‍ය රාජපක්ෂ මහතා පරාජයට පත්කිරීම ය. එහෙදී ඔවුන්ට කළ හැකි හොඳම කාර්යය සන්ධානයෙන් ජ වි පෙ ඉවත්කිරීම ය. ජ වි පෙ නොමැතිව ගොඩනගන සන්ධානයකින් වාසිය රනිල් වික්‍රමසිංහ මහතාට ය. සන්ධානයේ ජ වි පෙ නොමැතිවීමත් සමග විශාල පිරිසක් අධෛර්යයට පත්වෙති. ලංකාවේ බොහෝ දෙනා ඡන්දය දෙන්නේ දිනාවියැයි සිතන අපේක්ෂකයකුට ය. ජ වි පෙ නොමැතිව රාජපක්ෂ මහතාට ජයග්‍රහණය කළ හැකි යැයි කියන බොහෝ දෙනා කරන්නේ රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය දීම ය. ඡන්දය දිනීමට නම් රාජපක්ෂ මහතා මුල දී ම ඡන්දය දිනාසිටින (දිනන) බව මහජනයාට සන්නිවේදනය විය යුතු ය.

© Prof. Nalin De Silva

එහෙත් බැලයන්ට අවශ්‍ය එහි විරුද්ධ පැත්ත ඉටුවනු දැකීම ය. ඔවුන්ගේ උපදෙස් ඒ සඳහා ය. බැලයන්ට අනුව රාජපක්ෂ මහතා ප්‍රගතිශීලියෙකි. රදළවාදය පිටුදකින්නෙකි. ඔහු ඊනියා වමේ ය. ඒ සියල්ල ඔවුන් රාජපක්ෂ මහතාට ඡන්දය දෙන බවට කරන හැඟවීම් ය. ඒ රැවටීමකි. මෙරට ප්‍රධාන ප්‍රශ්නය දෙමළ ජාතිවාදී ප්‍රශ්නය බව බැලයෝ ද ඔවුන් සමග සිටින සාමදූතයෝ ද දනිති. දෙමළ ජාතිවාදී ප්‍රශ්නය දෙමළ ජාතිවාදයට අවශ්‍ය අන්දමට විසඳීමට කටයුතුකරන ප්‍රධාන තැනැත්තා රාජපක්ෂ මහතා ද නැත්නම් වික්‍රමසිංහ මහතා ද? රාජ්‍ය නොවන උගතුන් කිහිප දෙනකු හා වාසුදේව නානායකාකාර මහතා වැනි හැළිගිය වමේ  නායකයන් රාජපක්ෂ මහතාට ආධාරකළ ද, බලපෑම්කළ ද, විශේෂයෙන්ම සාමදූතයන්ට ප්‍රිය රනිල් වික්‍රමසිංහ මහතා ය. ඔවුහු ජ වි පෙ සම්බන්ධකිරීමෙන් අවාසියක් වන්නේ යැයි රාජපක්ෂ මහතාට ලණු දෙන අතර ම තම ඡන්දය වික්‍රමසිංහ මහතාට දෙති. බැලයෝ ද සාමදූතයෝ වෙති. ඔවුන් රාජපක්ෂ මහතාගේ ඊනියා ප්‍රගතිශීලී බවට විශාල ප්‍රචාරයක් දෙන අතර වික්‍රමසිංහ මහතාට ඡන්දය දෙනු ඇත. හිටපු මාක්ස්වාදීන් හා සාමදූතයන් ගැන කිවහැක්කේ ඔවුන් මහජනතාව රැවටීම සඳහා මොන ප්‍රගතිශීලී කතා කීව ද ඔවුන් ඡන්දය දෙනු ඇත්තේ වික්‍රමසිංහ මහතා ට ය. එසේ නොකරනු ඇත්තේ මාක්ස්වාදය යනු කිසි දිනෙක වලංගු වු දහමක් නොවන බව නොදැන තවමත් මාක්ස්වාදියකු ලෙස කටයුතු කිරීමට උත්සාහ කරන වාසුදේව නානායක්කාර මහතා වැන්නවුන් ය. එහෙත් එවැන්නවුන් දහස් ගණනින් රටේ නැති බව වෙන කාටත් වඩා හොඳින් මහින්ද රාජපක්ෂ මහතා දන්නවා ඇත.

අද මෙරට ඇත්තේ ඊනියා ප්‍රතිගාමී ප්‍රගතිශීලී කඳවුරු අතර අරගලයක් නො වෙයි. පගතිශීලියා කවු ද ප්‍රතිගාමියා කවු ද යන්න තීරණයකිරීමේ නිර්ණායක කවරේ ද? මාක්ස් ඇදහීම ද? නැත්නම් මාක්ස් ගැන විශ්වාසයක් තැබීම ද? ලිබරල්වාදී වීම ද? ඩෙරීඩා කියවීම ද නැත්නම් හේබර්මාස් කියවීම ද? මාක්ස්වාදී වේවා, පශ්චාත් මාක්ස්වාදී වේවා, පශ්චාත් නූතනවාදී වේවා, ලිබරල්වාදී වේවා, අර වාදී වේවා, මේ වාදී වේවා, මොවුහු කවුරුත් දෙමළ ජාතිවාදයට පක්ෂ වෙති. ප්‍රතිගාමී ප්‍රගතිශීලී බෙදීම් අප රටවල තබා බටහිර රටවල ද වලංගු නැත. අද මෙරට ප්‍රශ්නය ඇත්තේ, අරගලය ඇත්තේ ජාතික බලවේග හා විජාතික බලවේග අතර ය. මහින්ද රාජපක්ෂ මහතාට ඊනියා ප්‍රතිගාමත්වයට එරෙහි ව ප්‍රගතිශීලීත්වය සමග එකතුවීමේ අවශ්‍යතාවක් නො වෙයි. එයට හේතුව එවැනි බෙදීමක් නො මැතිවීම ය. ජ වි පෙ මගහැර ගොස් එවැනි බොරු ප්‍රගතිශීලී එකතුවක් ඔස්සේ රාජපක්ෂ මහතාට ලබාගත හැක්කේ පරාජයක් පමණකි. රාජපක්ෂ මහතාට බණ්ඩාරනායකවරුන්ගේ ද රාජ්‍ය නොවන ගැත්තන්ගේ ද, වෙනත් දීනයන්ගේ ද බටහිරයන්ගේ ගැටවලට හසු නොවී ජයග්‍රහණය කළ හැක්කේ ජාතිකත්ව බලවේග හා එකතුවීමෙන් ය. එහි දී ශ්‍රී ල නි පක්ෂයේ ඇති වැදගත්කම නොසලකා හැරිය  නො යුතු ය.

ශ්‍රී ල නිප යනු 1955 පමණ සිට සිංහලත්වයේ පක්ෂය වෙයි. එය 1951 දී ලිබරල් පක්ෂයක් ලෙස බිහිවිණි. එහෙත් 1952 දී ත් පක්ෂයට ල ස ස ප තරම් ඡන්ද දිනාගැනීමට නො හැකි විය. ඉන්පසු 1955න් පසුව ජාතිකත්වයේ පක්ෂය වීමෙන් පසුව අතුරු මැතිවරණ දිනා 1956 දී ම එ පෙ නිර්මාණයකර ආණ්ඩුවක් පිහිටුවීමට ඒ පක්ෂයට හැකි විය. ඒ පක්ෂයේ ස්ටැන්ලි සොයිසාලා හා පීම් මුණසිංහලා එකල ද සිටිය ද ඩී ඒ රාජපක්ෂලා ද සිටියහ. මහජනයාට අනුව ඒ පක්ෂය 1955න් පසුව සිංහලත්වයේ පක්ෂය විය. අද ශ්‍රී ල නි ප, තවත් මහජන පක්ෂයක් බවට පත්කෙරී ඇත්තේ රාජ්‍ය නොවන ගැත්තන් හා වෙනත් විජාතික බලවේග මෙරටට ගෙන ආ  නායක නායිකාවන් විසින් ය. මහින්ද රාජපක්ෂ මහතා කළ යුත්තේ අප කලින් ද කියා ඇති පරිදි ශ්‍රී ල නි ප නැවතත් ශ්‍රී ල නි පක්ෂයක් බවට පත්කිරීම ය. ජ වි පෙරමුණ ඉදිරිපත් කරන කොන්දේසි සලකා බැලීම ය. ඒ අනුව ඒ පක්ෂය ද ඇතුළත් නව සන්ධානයක් ගොඩ නැගීම ය.  ඒ අතර ඊනියා බුද්ධිමතුන්ගේ සංකල්ප අළුයම  ලූ කෙළ පිඬක් මෙන් සැලකීම ය.

රාජපක්ෂ මහතාට ජ වි පෙ සමග එකතුවීම ප්‍රායෝගික වශයෙන් පමණක් වුව ද වැඩදායක ය. ජ වි පෙරමුඹණට මහා මැතිවරණයේ දී ලැබුණු මනාප සියල්ලක් ම මෙවර ඡන්ද වශයෙන් නොලැබිය හැකි වුව ද ඒ ඔස්සේ රාජපක්ෂ මහතාට ලැබෙන ඡන්ද මගින් දෙමළ ඡන්ද නොලබා ම වුව ද ජනාධිපති විය හැකි ය. එහෙත් දෙමළ ජාතිවාදී හොඳහිත ලබාගනිමින් ඔවුන්ගේ ඡන්ද ද ගත්ත ද , රාජපක්ෂට මහතාට ජයග්‍රහණය කළ නො හැකි ය. පසුගිය මැතිවරණයේ දී සන්ධානය ජයග්‍රහණය කෙළේ සිංහල බෞද්ධ ඡන්දවලින් බව පැහැදිලි ය.  අවශ්‍ය වන්නේ මේ ඡන්ද නැවතත් ලබාගැනීමය. ඒ ඡන්දවලට තවත් ඡන්ද එකතුවීමට ඇති ඉඩකඩ බොහෝ ය. විශේෂයෙන් ම කොටි විරෝධී පක්ෂවලට ජනතාවගේ තදබල කැමැත්තක් වෙයි.  ජ වි පෙ එකතුවීම නිසා ලැබෙන ඡන්ද ප්‍රමාණයට අඩු ඡන්ද ප්‍රමාණයක් දෙමළ ඡන්ද නැතිවීමෙන් නැති වෙයි. එබැවින් රාජපක්ෂ මහතා විජාතික බලවේගවල ගැටවලට හසු නොවිය යුතු ය.

© Prof. Nalin De Silva